#### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1913/4 - 2015 මැයි මස 05 වැනි අඟහරුවාදා - 2015.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 ජනවාරි මස 18 වැනි දිනැති අංක 1897/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය 2015 අප්‍රේල් මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති

2015 අප්‍රේල් මස 29 වැනි දින
කොළඹ 01
ජනාධිපති කාර්යාලය

උපලේඛනය

(1) එම නිවේදනයෙහි මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය (අංක 16) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 4 සහ 5 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය (අංක 21) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 9 අයිතමය ඉවත් කිරීමෙන්;

(3) එම නිවේදනයෙහි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය (අංක 23) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 5 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)" ඉවත් කිරීමෙන්;

1A - G 21479— 416 (2015/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(4) එම නිවේදනයෙහි උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය (අංක 35) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 16, 17 සහ 18 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)

(5) එම නිවේදනයෙහි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය (අංක 39) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) II වැනි තීරුවෙහි දැක්වෙන 8 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

9. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
10. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
11. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනත (1995 අංක 12)" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාල පනත (2014 අංක 31)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)

(6) එම නිවේදනයෙහි ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය (අංක 41) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 10 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

11. අපේ ගම
12. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම
13. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය
14. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්;

- "ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)"

05-452

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.